# ශ්‍රී ලංකාවේ විසංවාද මර්දනය

**ජනවාරි - මාර්තු, 2014**



2014 මාර්තු 15, වවුනියාව - මානව හිමිකම් ක්‍රියාකාරිනී බාලෙන්ද්‍රන් ජයකුමාරි අත් අඩංගුවට ගැනීමට එරෙහිව පැවැති විරෝධතාවයක දී, අතුරුදහන් වූ සිය පියාගේ ඡායාරූපයක් අතැතිව සිටින දරුවෙක් (ඡායාරූපය: නිර්නාමික)


**ඉන්ෆෝම්** මානව හිමිකම් දත්ත කේන්ද්‍රය

informcolombo@gmail.com

# ආවරණය කළ සිද්ධි

සාරාංශය ........ 2
ආ. මානව හිමිකම් ආරක්ෂකයන් තිදෙනෙකු අත්අඩංගුවට ගැනීම ........ 4
ඇ. යුද්ධ අපරාධ සම්බන්ධව වගවීම පිළිබඳව අධ්‍යාවනය කරන පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට තර්ජනය කිරීම ........ 5
ඈ. වගවීම උදෙසා ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාකාරී වන ශ්‍රී ලාංකිකයන්ට එරෙහිව වෛර ප්‍රචාර.. 6
උ. එක්සත් ජාතීන්ගේ සංවිධානයට තොරතුරු සැපයූ ඇමැතිවරයකුට එරෙහි පළිගැනීම් ........ 9
ඌ. ගෝලීය කාන්තා කටයුතු පිලිබඳ ඇමරිකානු තානාපතිනියට වීසා ලබාදීම ප්‍රතික්ෂේප කිරීම 10
එ. අදහස් ප්‍රකාශකිරීමේ නිදහසට එරෙහිව පහරදීම් හා බාධා ........ 10
ඒ. සාමකාමීව එක්රැස් වීමේ නිදහසට එරෙහි මර්දනය ........ 11
ඉ. විශ්ව විද්‍යාල ශිෂ්‍ය ක්‍රියාකාරීන්ට එරෙහිව සිදුකරනු ලබන මර්දනය ........ 13
ඊ.මානව හිමිකම් උල්ලංඝණයන්ට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණ සහාය පතන්නන්ට කරන තර්ජන..... 14
එ. ආගමික නිදහස වෙනුවෙන් පෙනී සිටියෙකුට එරෙහි මර්දනය ........ 14
ඒ. මැතිවරණ කාල සීමාව තුල විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය ........ 15

*ඉන්ෆෝම් ආයතනය 1990 දී ආරම්භ කරන ලද්දේ විශේෂයෙන්ම වාර්ගික ගැටුම සහ යුද්ධය සන්දර්භයෙහි ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය නිරීක්ෂණය කරමින් කරුණු ගොනු කිරීමටත් එම කරුණු ලිඛිත සහ වාචික මැදිහත්වීම් හරහා ප්‍රාදේශීයව, ජාතිකව සහ ජාත්‍යන්තරව වාර්තා කිරීමටත් ය. එසේම සිය අයිතීන් නිරන්තරයෙන් සහ ක්‍රමවත් ලෙස කෙලෙසීමට ලක්වන අනෙක් ජන ප්‍රජාවන් සමග ද ඉන්ෆෝම් ආයතනය කටයුතු කරයි. වර්තමානයේ දී ඉන්ෆෝම් ආයතනය මැතිවරණ නිරීක්ෂණය, මාධ්‍ය නිදහස සහ මානව හිමිකම් ආරක්ෂකයින් සම්බන්ධයෙන් සිය අවධානය යොමු කර තිබේ. ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටා ඇති ඉන්ෆෝම් ආයතනය දේශීය ක්‍රියාධරයින්, කණ්ඩායම් සහ ජාලයන් සමඟ මෙන්ම කලාපීය සහ ජාත්‍යන්තර මානව හිමිකම් ජාලයන් සමග සහයෝගයෙන් කටයුතු කරයි.*

## සාරාංශය

අදාළ කාල සීමාවේ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සංදර්භය තුල ප්‍රධාන ලෙසම අවධානය යොමු වූයේ 2014 වසරේ මාර්තු මස පැවැති මානව හිමිකම් කවුන්සිලයේ සැසිවාරය දෙසටයි. මෙහි දී ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් යෝජනාවක් සම්මත විය. එහි දී වත්මනෙහි සිදුවෙමින් පවතින මානව හිමිකම් උල්ලංඝණයන් සහ පෙර සිදුවූ මානව හිමිකම් උල්ලංඝණයන් සඳහා දඬුවම් නොලැබීමේ වාතාවරණය හෙළාදැකීම මෙන්ම, දේශීය වශයෙන් වගවීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමට සහ මානව හිමිකම් උල්ලංඝණයවීම් පිළිබඳ ජාත්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීමට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරියට නියම කරන ලදී. මෙම ක්‍රියාවලිය සඳහා විරෝධය පළ කළ ශ්‍රී ලංකාවේ රජය එවැනි ක්‍රියාවලියක් සමග සම්බන්ධ වන්නන්, සහයෝගය දෙන්නන්, ද්‍රෝහීන්, ත්‍රස්තවාදයට සහයෝගය දෙන්නන් සහ සැඟවුණු න්‍යාය පත්‍රයක් මත ක්‍රියාකර රාජ්‍යය අවමානයට පත් කිරීමට කටයුතු කරන්නන් ලෙස මහජන ප්‍රචාරයක් අරඹන ලදී. රාජ්‍ය මාධ්‍ය මගින් ගෙන ගිය එම ප්‍රචාරයට ශ්‍රී ලංකාව තුළ වෙසෙන දෙමළ දේශපාලනඥයන්, මානව හිමිකම් ක්‍රියාකාරීන්, දෙමළ ක්‍රිස්තියානි පූජකයන් පමණක් නොව විදේශ රාජ්‍යයන්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිලධාරීන් සහ දෙමළ ඩයස්පෝරා සාමාජිකයන් ද ඉලක්ක විය. මාර්තු සහ අප්‍රේල් කාලය තුළ එල්ටීටීඊ සංවිධානය ප්‍රතිසංවිධානය කිරීම සම්බන්ධයෙන් සැකපිට පුද්ගලයන් 65 දෙනෙකු 65 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති බව ද, අප්‍රේල් මැද භාගය වන විට ඉන් 13 දෙනෙකු නිදහස් කර ඇති බවද පොලීසිය ප්‍රකාශ කර ඇත.

ජිනීවා යෝජනාවට පූර්ව තෙමාසය සලකා බලන කල, විසම්මුතික මතවලට එරෙහිව සිදු කෙරුණු මර්දන විශාල පරිමාණයෙන් සිදුවූ බව අපට පෙනී යයි. උද්සෝෂණවලට හා සම්මන්ත්‍රණවලට බාධා කරන ලද අතර, ජනමාධ්‍යවේදීන්ට තර්ජනය කිරීම්, සීමා පැනවීම්, සහ සාවද්‍ය චෝදනාවලට ලක් කිරීම වාර්තා විය. නැගෙනහිර පළාතේ දී හමුදාව මගින් ඉඩම් අත්පත් කර ගැනීමට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිලි කළ පුද්ගලයන් තර්ජනයට ලක් වූ අතර, කොළඹ දී ආරක්ෂක අමාත්‍යාංශය විසින් බලහත්කාරයෙන් නිවාසවලින් ඉවත් කිරීම පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කළ ප්‍රජා නායකයකු පැහැර ගැනීමට ලක් විය. පාලක පක්ෂයේ ප්‍රාදේශීය දේශපාලකයකු වන ශ්‍රී ලංකාවේ ඌව පළාතේ බෞද්ධ භික්ෂුවක් ද සුළුතර ආගමික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ඉදිරිපත් වීම නිසා අඛණ්ඩ තර්ජනයට ලක්වෙමින් සිටී. විශ්ව විද්‍යාල ශිෂ්‍ය සංගම් මෙන්ම ශිෂ්‍ය ක්‍රියාකාරීන් ද දිවයින පුරාවට විවිධාකාරයේ තර්ජනයන්ට ලක්වෙමින් සිටී. කාන්තා කටයුතු පිළිබඳ ඇමරිකානු තානාපති කැතරින් රසල් හට ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට අවස්ථාව ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලැබීය. බස්නාහිර හා දකුණු පළාත් සභා මැතිවරණ ප්‍රචාරක ක්‍රියාවලිය තුළ විරුද්ධ පක්ෂ ක්‍රියාකාරීන් හට පහර දීම සහ බාධා කිරීම නිරන්තරයෙන් සිදු විය.

පොලීසිය, හමුදාව, රජයේ ඇමැතිවරුන්, රජයේ සහ රජයේ සහාග පක්ෂවල දේශපාලනඥයන්, රජයයට හිතැති ආගමික කණ්ඩායම් සහ රාජ්‍ය මාධ්‍ය ඉහත සිද්ධිවලට සම්බන්ධ බවට පෙනී යයි. දඬුවම් නොලැබීම හේතුවෙන් උල්ලංඝණයන් දිගින් දිගටම සිදුවන අතර පොලීසිය, නීතිපති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, සහ අධිකරණය මගින් ඒවා සඳහා ප්‍රතිකර්ම ලබා දීමට නොහැකියාවක් හෝ උවමනාවක් නොදැක්වීමේ ස්වභාවයක් පෙන්වනු ලබයි. එහෙත් වින්දිතයන් සහ ඔවුන්ගේ පවුල්, මානව හිමිකම් ආරක්ෂකයන්, නීතිඥවරු, මාධ්‍යවේදීන්, විපක්ෂ දේශපාලනඥයන්, සහ ආගමික නායකයන් සුළු සංඛ්‍යාවක් මෙම මානව හිමිකම් උල්ලංඝණයවීම් හෙළිදරව් කිරීම, ඒවාට විරෝධය පෑම, සහ මානව හිමිකම් සුරැකීම වෙනුවෙන් පෙනී සිටිති. ජනවාරි- මාර්තු දක්වා ඉන්ෆෝම් ආයතනයට වාර්තා වූ සහ මාධ්‍ය මගින් වාර්තා කළ විසංවාදය මර්දනය කිරීමේ සිද්ධි කිහිපයක් පහත දැක්වේ.

## අ. මානව හිමිකම් ආරක්ෂකයකු පැහැරගැනීම

### 1. සුනිල් සමරධීර

වනාතමුල්ල යනු කොළඹ නගරය ආශ්‍රිත අඩු ආදායම් ලාභී පවුල් පදිංචි ප්‍රදේශයක් වන අතර, එහි දැනට පදිංචිව සිටින පදිංචිකරුවන් සිය සම්ප්‍රදායික සහ නීත්‍යානුකූල ස්ථානවලින් හමුදාව යොදවා ඉවත් කොට ඔවුන් නැවත වෙනත් ස්ථානයක පදිංචි කිරීමට සැලසුම් කර ඇති ප්‍රදේශයන්ගෙන් එකකි. සුනිල් වනාතමුල්ල නිවාස අහිමි වන්නන් ගේ සමිතිය නියෝජනය කරන සාමාජිකයකු වන අතර පෙබරවාරි මාසයේ නිවාස ඉවත් කිරීම පිළිබඳ ඇති වූ සාකච්ඡාවක දී ඔහු සහ ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් ගෝඨාභය රාජපක්ෂ අතර බහින් බස් වීමක් ඇති විය. පෙබරවාරි 15 වන දින සුනිල් නොහඳුනන කණ්ඩායමක් විසින් පැහැරගෙන යන ලද අතර වනාතමුල්ල ප්‍රදේශවාසීන් විසින් මහාමාර්ගය අවහිර කරමින් කරනු ලැබූ උද්ඝෝෂණයක ප්‍රතිඵලයක් ලෙස ඔහු නිදහස් කර ඇත[1]




2009 2014 - 2 - 13
Thursday 22

*සුනිල් සමරධීර විසින් තමා සහ ආරක්ෂක ලේකම්වරයා අතර ඇති වූ වාදය සිය පිළිබඳව එදින රාත්‍රියෙහි තැබූ සටහන (ඡායාරූපය - ලංකා ට්‍රැත්)*

[1] http://www.lankatruth.com/home/sinhala/index.php?option=com_content&view=article&id=9828:2014-02-22-14-58-11&catid=36:2011-10-17-04-27-38&Itemid=72

## ආ. මානව හිමිකම් ආරක්ෂකයන් තිදෙනෙකු අත්අඩංගුවට ගැනීම

### 2. බාලේන්ද්‍රන් ජෙයකුමාරි

2014 මාර්තු මස 14 වන දින, බාලේන්ද්‍රන් ජෙයකුමාරි උතුරු පළාතේ කිලිනොච්චියේ පිහිටි ඇයගේ නිවසේ දී ත්‍රස්තවාදී විමර්ශන ඒකකය විසින් අත්අඩංගුවට ගත් අතර දැනට ඇය බූස්ස රැඳවුම් කඳවුරේ රඳවා තබාගෙන ඇත[2]. ඇය සහ ඇයගේ දියණිය අතුරුදහන් වූවන් පිළිබඳ සත්‍ය සොයාගැනීම සඳහා විරෝධතාවයන්වලට සම්බන්ධ වූ අතර අගෝස්තු 30 වන දින එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරියගේ පැමිණීම සම්බන්ධව හා නොවැම්බර් මාසයේ බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍යවරයාගේ පැමිණීම සම්බන්ධයෙන් අතුරුදහන්වූවන්ගේ පවුල් එකතුව විසින් සංවිධානය කරන ලද උද්ඝෝෂණවලට සහභාගි වීම නිසා ඇයට හා ඇයගේ දියණියට විශාල මාධ්‍ය ප්‍රචාරයක් ලැබුනි.



*මානව හිමිකම් මහ කොමසාරිස් නවී පිල්ලේගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුර ඇය හමු වූ බාලේන්ද්‍ර ජෙයකුමාරිගේ දියණිය විබූෂිකා දැන් ළමා නිවාසයක රඳවා සිටින්නේ මව බූස්ස කදවුරෙහි රඳවා ඇති නිසා ය.* (ජායාරූපය - ග්ලෝබල් ටැමිල් නිව්ස්)

### 3. රුකී ප්‍රනාන්දු සහ ප්‍රවීන් මහේසන් පියතුමා

කොළඹ ඉන්ෆෝම් මානව හිමිකම් දත්ත කේන්ද්‍රයේ උපදේශක රුකී ප්‍රනාන්දු හා යාපනය සාමය හා සංහිඳියාව සඳහා වූ කේන්ද්‍රයේ හිටපු අධ්‍යක්ෂක ප්‍රවීන් මහේසන් පියතුමා මාර්තු මස 16 වන දින රාත්‍රියේ ත්‍රස්තවාදී විමර්ශන ඒකකය විසින් අත්අඩංගුවට ගනු ලැබීය.[3] උතුරේ ඇති හමුදාකරණය යටතේ ජෙයකුමාරි ඇතුළු තවත් අය අත්අඩංගුවට ගැනීම පිළිබඳව සොයා බැලීමට ඔවුන් දෙදෙනා ගොස් සිටි අතර, එම අත් අඩංගුවට හේතු ලෙස දක්වා තිබුනේ එල්ටීටීඊ සංවිධානය ප්‍රතිසංවිධානය කිරීමට ආධාර, අනුබල දීම, රජය අපහසුතාවයට පත්කිරීම හා ජනතාව අතර අසමගිය ඇති කිරීමට කටයුතු කිරීම සහ තොරතුරු පිටරටවලට යවා මුදල්

---

[2] http://www.amnesty.org/en/library/asset/ASA37/006/2014/en/be93015f-1ea7-4a2b-bb36-2e8029f66737/asa370062014en.html

[3] http://www.amnesty.org/en/news/sri-lanka-free-prominent-human-rights-defenders-ruki-fernando-and-father-praveen-2014-03-17

ඉපැයීමයි. ඔවුන් දෙදෙනාම පෙබරවාරි 19 වන දින චෝදනා රහිතව නිදහස් කරන ලදී. අත්අඩංගුවේ සිටියදී, රූකී ප්‍රනාන්දු ඔහුගේ නීතිඥයන් හමුවීමට ඉල්ලා සිටියද, ඔහුගේ නීතිඥයන් කිහිප විටක්ම ඔහු හමු වීමට ඉල්ලීම් කළ ද, එයට ඉඩ නොදෙන ලදී.[4] පැය 51 ක පමණ කාලයක් රඳවා තබා ගැනීමෙන් අනතුරුව ඔහු නිදහස් කරන ලදී. එයට පසුව ඔහු ජාත්‍යන්තර හා දේශීය මාධ්‍යයන්ට සම්මුඛ සාකච්ඡා ලබාදෙන ලදී.[5] ඉන් අනතුරුව, නිදහස් කොට පැය 48ක් ඇතුළත ත්‍රස්තවාදී විමර්ශන ඒකකය විසින් නව උසාවි නියෝගයක් මගින් ඔවුන්ට අදාළ සිදුවීම හා ත්‍රස්තවාදී විමර්ශන ඒකකය විසින් සිදු කරනු ලබන පරීක්ෂණ පිළිබඳව කිසිවකු සමග සාකච්ඡා කිරීම ද, විදෙස් ගත වීම ද තහනම් කරනු ලැබීය. එමෙන්ම ඔවුන්ගේ අයිපෑඩ් හා දෘඩාංග තැටිය (හාඩ් ඩිස්ක්) ත්‍රස්තවාදී විමර්ශන ඒකකයට භාර දෙන ලෙස නියෝග කරන ලද අතර නව චෝදනා ද ගොනු කර ඇත.



*රූකී ප්‍රනාන්දු: මුකවාඩම් ලා ඇත ( ඡායාරූපය- ක්ෂමා ජාත්‍යන්තරය)*

## ඇ. යුද අපරාධ සම්බන්ධව වගවීම පිළිබඳව අධිවාචනය කරන පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට තර්ජනය කිරීම

### 4. රදගුරු තෝමස් සවුන්ද්‍රනායගම් පියතුමා හා රදගුරු ආචාර්ය රායප්පු ජෝෂප් පියතුමා

යාපනය කතෝලික රදගුරු තෝමස් සවුන්ද්‍රනායගම් සහ මන්නාරම කතෝලික රදගුරු ආචාර්ය රායප්පු ජෝෂප් අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කළ යුතු බව රාවණා බලය සංවිධානය ප්‍රකාශකරයි. රාවණා බලය සංවිධානයේ ලේකම් පූජ්‍ය ඉත්තෑකන්දේ සද්ධාතිස්ස හිමියන් පොලිස් මූලස්ථානයට පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කරනු ලැබුවේ මෑතක දී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූ ඇමරිකා එක්සත් ජනපද යුද අපරාධ පිළිබඳ තානාපති ස්ටීවන් රැප් මහතා

---

4 http://www.sacw.net/article8006.html
5 http://edition.cnn.com/2014/03/19/world/asia/sri-lanka-ruki-fernando-arrest/index.html, http://www.bbc.com/news/world-asia-26641597, http://njviehland.wordpress.com/2014/03/22/ruki-fernando-is-out-of-detention-but-hes-not-free/

හට යුද අපරාධ සම්බන්ධයෙන් රදගුරුවරුන් අසත්‍ය තොරතුරු සපයා ඇතිබවයි. ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ ප්‍රකාශ පදනම් කර ගෙන අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කළ යුතු බව මාධ්‍ය වෙත අදහස් දක්වමින් පූජ්‍ය ඉත්තෑකන්ද සද්ධාතිස්ස හිමියන් ප්‍රකාශ කරන ලදී.[6]

### 5. ආනන්දි ශශීධරන්

උතුරු පළාත් සභාවේ මන්ත්‍රී ආනන්දි ශශීධරන් අත්අඩංගුවට ගෙන එල්ටීටීඊ සාමාජිකයන් පුනරුත්ථාපනය කරනු ලබන කඳවුරකට යොමු කිරීම පිළිබඳව අවධානයක් යොමුකර ඇති බව ආරක්ෂක අමාත්‍යාංශය පවසයි[7]. යුද්ධයේ අවසාන අදියරේ දී රජයට භාර වීමෙන් පසු අතුරුදහන් වූ එල්ටීටීඊ නායකයකු වූ එලිලන් ගේ බිරිඳ වන ඇය අතුරුදහන් වුවන්ගේ පවුල් වෙනුවෙන් පෙනී සිටින අතර ජාත්‍යන්තර මානව හිමිකම් පරීක්ෂණයක් පිළිබඳ සංවාදය තුළ ශ්‍රී ලංකා රජයේ පාර්ශවයට අභියෝගයක් වී ඇති බව පෙනෙන්නට ඇත. මෙයට ප්‍රතිචාර දක්වනු ලැබූ ආනන්දි ශශීධරන් මාධ්‍ය හමුවේ කියා සිටිනු ලැබුවේ ඇය අත්අඩංගුවට ගත හොත් රජයට ජාත්‍යන්තර වශයෙන් බරපතල ප්‍රතිවිපාක වලට මුහුණ දීමට සිදුවන බවයි[8]

## ඈ. වගවීම උදෙසා ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාකාරී වන ශ්‍රී ලාංකිකයන්ට එරෙහිව වෛර ප්‍රචාර

### 6. රදගුරු තෝමස් සවුන්දරනායගම් හා රදගුරු ආචාර්ය රායප්පු ජෝෂප් පියතුමා

එල්ටීටීඊ සංවිධානයට එරෙහිව ආණ්ඩුවේ හමුදාව දියත් කල යුද්ධයේ දී ලබා ගත් ජයග්‍රහණයන් අවතක්සේරු කිරීමට ජාත්‍යන්තර බලවේග ක්‍රියාත්මක වන බව කෑගල්ලේ පැවති හැට හය වෙනි නිදහස් උළෙල අමතමින් ජනාධිපති මහින්ද රාජපක්ෂ ප්‍රකාශ කරනු ලැබීය. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ජිනීවා මානව හිමිකම් කොමිසම වෙත ඉදිරිපත් කිරීමට නියමිත යෝජනාව සම්බන්ධව අදහස් දැක්වූ ඔහු ප්‍රකාශ කරනු ලැබුවේ එය සාමය අකමැති අයගේ ජයග්‍රහණයක් ලෙසිනි. වර්තමානයේ ශ්‍රී ලංකාවට සටන් කිරීමට සිදුවී ඇත්තේ ජාතීන් හා පක්ෂ අතර නොව රටට හිතවත් අය හා ද්‍රෝහීන් අතර අරගලයක් බව ප්‍රකාශ කරන ලදී[9]

මන්නාරමේ කතෝලික රදගුරු ආචාර්ය රායප්පු ජෝෂප් හා යාපනය කතෝලික රදගුරු තෝමස් සවුන්දරනායගම් විසින් ශ්‍රී ලංකා හමුදාව විසින් 4වන ඊලාම් යුද්ධයේ අවසාන භාගයේ පොකුරු බෝම්බ සහ රසායනික අවි භාවිතා කිරීම සම්බන්ධයෙන් එල්ල කරනු ලබන චෝදනා සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ කතෝලික රදගුරු සම්මේලනයේ අනුමැතිය පළ නොකරන බව අති උතුම් කාදිනල් මැල්කම් රංජිත් පියතුමා පවසයි. ඇමරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තුමේන්තුවේ යුද අපරාධ පිලිබඳ තානාපති ස්ටීවන් ජේ රැප් සහ ඇමරිකා එක්සත් ජනපද තානාපති මයිකල් ජේ සූසන් සමග උතුරේදී පැවැත්වූ සාකච්ඡාවේ දී මන්නාරම රදගුරු හා යාපනය රදගුරු යුද අපරාධ පිළිබඳ ජාත්‍යන්තර පරීක්ෂණයක් ඉල්ලා සිටීම සම්බන්ධයෙන් දි අයිලන්ඩ් පුවත්පත කරන ලද විමසුමේ දී කොළඹ අගරදගුරු අති උතුම් කාදිනල් මැල්කම් රංජිත්

---

[6] www.hirufmnews.lk 16th of January 2014
[7] http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=95913
[8] http://colombogazette.com/2014/01/15/anandi-cautions-against-arrest/
[9] http://www.tbcuk.net/?p=28178

කාදිනල් අවධාරණය කර සිටියේ එම විවාද සම්පන්න ප්‍රකාශය රදගුරුවරුන්ගේ පෞද්ගලික මතයන් මත පදනම් වන බවයි.[10]

මේ අතර මාධ්‍ය හමුවක් පවත්වමින් ධර්මපාල පරපුර සංවිධානය ප්‍රකාශ කරනු ලැබුවේ ශ්‍රී ලංකාවේ බෞද්ධ සහ කතෝලික ජනතාව අතර විරසකයක් ඇතිකිරීමට උතුරේ රදගුරුවරුන් උත්සාහ කරන බවයි. පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමියන් මාධ්‍ය හමුවේ අදහස් දක්වමින් ත්‍රස්තවාදී ප්‍රකාශ කරනු ලබන රදගුරුවරුන් සම්බන්ධව කතෝලික සභාව ක්‍රියාත්මක වියයුතු බවය.[11]

**7. මානව හිමිකම් ක්‍රියාකාරීන් 08 දෙනෙකු සහ සිවිල් සංවිධාන 24ක්**

මාර්තු 6 වනදින ජාතික රූපවාහිනී නාලිකාවේ රාත්‍රි 8 ට විකාශනය වන ප්‍රවෘත්ති තුලින් මානව හිමිකම් සංවිධාන 8 ක ප්‍රධානීන්ගේ ඡායාරූප පසුබිමේ පෙන්වමින් ලංකාවේ විවිධ ප්‍රදේශ වල ක්‍රියාත්මක වන සංවිධාන 24ක් එක්සත් ජාතීන් ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලයට අසත්‍ය තොරතුරු සහිත වාර්තාවක් රට අපකීර්තියට පත්කිරීම සඳහා ඉදිරිපත් කර ඇති බවට ප්‍රකාශ කරන ලදී.[12]

**8. සුනන්ද දේශප්‍රිය සහ නිමල්කා ප්‍රනාන්දු**

ශ්‍රී ලංකා ස්වාධීන රූපවාහිනී සේවය 2014 මාර්තු 14 දින ප්‍රවෘත්ති විකාශය සමඟ විකාශනය කරනු ලබන විමසුම වැඩසටහනින් ප්‍රකාශකරනු ලැබුවේ මවුබිමට ද්‍රෝහී දේශීය හා විදේශීය සතුරන් එකතුව ජිනීවා යෝජනාව සම්මත කරගත් බවයි. එලෙස විකාශනය කරන අතරතුර දෘශ්‍ය ලෙස විකාශනය කරනු ලැබුවේ ශ්‍රී ලංකාවේ ප්‍රකට මානව හිමිකම් ආරක්ෂකයන් වන නිමල්කා ප්‍රනාන්දු හා සුනන්ද දේශප්‍රිය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ අසුන්ගෙන සිටින දර්ශනයි. විමසුම වැඩසටහන තුල නැවත නැවත නිමල්කා ප්‍රනාන්දු හා සුනන්ද දේශප්‍රිය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ අසුන්ගෙන සිටින දර්ශනය ප්‍රදර්ශනය කරමින් ප්‍රකාශ කරනු ලැබුවේ ලැබුවේ ඩොලර් නෝට්ටු වලට කෑදර වී සිටින පිරිසක් මානව හිමිකම් සමුළුවේ වාඩිවී සිටීම කනගාටුවට කරුණක් බවයි.[13] දිවයින පත්‍රය මගින් සුනන්ද දේශප්‍රිය සහ නිමල්කා ප්‍රනාන්දු මානව හිමිකම් කවුන්සිලයේ සැසිවාරවලට සහභාගි වීම සම්බන්ධව විවේචනය කරමින් තීරු ලිපි කිහිපයක් පළ කරන ලදී[14].

**9. ආනන්දි ශශීධරන්**

ශ්‍රී ලංකා සී නිව්ස් වෙබ් අඩවිය 2014 පෙබරවාරි 13 වනදින උතුරු පළාත් සභා මහඇමති විග්නේශ්වරන් මහතාගේ ඡායාරූපයක් පළ කරමින් වාර්තා කර තිබූ පුවත සඳහා මාතෘකාව ලෙස යොදා තිබුනේ " මම ජිනීවා යන්නේ නෑ, කොටි එලිලන්ගේ පවුල යවනවා" යනුවෙනි.

---

10 http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=95800
11 http://www.bbc.co.uk/sinhala/world/2014/01/140120_lanka_monks_bishops.shtml
12 http://www.srilankabrief.org/2014/03/reprisals-against-hrds-in-sri-lanka.html#more
13 http://varunamultimedia.com/videos/btv/vmtube/wimasuma/wimasuma_-28-03-14/play.html?1
14 http://www.divaina.com/2014/04/06/defence.html & http://www.divaina.com/2014/03/30/defence.html

තවදුරටත් එම පුවත තුළ දක්වා තිබුනේ මාර්තු මාසයේ පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩල සැසිවාරයට උතුරු පළාත් සභා මන්ත්‍රී ආනන්දී ශශීධරන් සහභාගී වන බවයි. ආනන්දී ශශීධරන් හිටපු එල්ටීටීඊ නායකයකු වූ එළිලන් ගේ බිරිඳ වන අතර රජයේ හමුදාවට භාර වීමෙන් පසු ඔහු අතුරුදහන් විය. ආනන්දී ශශීධරන් අතුරුදහන් වූවන්ගේ පවුල් වෙනුවෙන් පෙනී සිටින මානව හිමිකම් ක්‍රියාකාරිනියක් වෙයි.[15]

### 10. සන්ධ්‍යා එක්නැළිගොඩ




*සන්ධ්‍යා එක්නැළිගොඩ ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේ පසුගිය මාර්තු සභා වාරය අතරතුර පැවැති සමාන්තර රැස්වීමක ශ්‍රී ලංකාවේ අතුරුදහන්වීම් ගැන කතා කළේ ය. ( ඡායාරූපය - එස්. දේශප්‍රිය)*

සන්ධ්‍යා එක්නැළිගොඩ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පරිශ්‍රයේ දී ලෝක දෙමළ සංසදයේ සභාපති එමැනුවෙල් පියතුමා සමග කතා බහ කරමින් සිටින ඡායාරූපයක් පළ කර මාර්තු 30 දා 'දිවයින' පුවත්පත ඇයට ප්‍රහාරයක් එල්ල කර තිබුණි. ඉන් කියැවුණේ ඇය 'කොටි හිතවාදීන්' සමග කතා කරමින් සිටින බව යි. සන්ධ්‍යා එක්නැළිගොඩ 2010 ජනවාරි මාසයේ දී අතුරුදහන් කරවන ලද කාටූන් ශිල්පී සහ ජනමාධ්‍යවේදී ප්‍රගීත් එක්නැළිගොඩගේ බිරිඳය. ඇය ශ්‍රී ලංකාවේ සිදුවන අතුරුදහන් කිරීම් වලට එරෙහි ප්‍රධානතම ක්‍රියාකාරිනියකි. ලෝක දෙමළ සංසදය 2014 අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකාණ්ඩුව විසින් ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස සලකා තහනම් කරන ලදී.[16]

[15] http://lankacnews.com/sinhala/news/110229/
[16] http://www.divaina.com/2014/03/30/defence.html

## උ. එක්සත් ජාතීන්ගේ සංවිධානයට තොරතුරු සැපයූ ඇමැතිවරයකුට එරෙහි පළිගැනීම්

**11. රාවුෆ් හකීම්**

එක්සත් ජාතීන්ගේ සංවිධානයත් සමග කටයුතු කරන මානව හිමිකම් ආරක්ෂකයන්ට එරෙහිව පලිගැනීම් කිරීම ශ්‍රී ලංකාව තුළ ඉතා බහුල වශයෙන් සිදුවෙයි. ඒ සම්බන්ධව මෑත උදාහරණයක් වන්නේ රජයේ හවුල්කාර පක්ෂයක් වන මුස්ලිම් කොන්ග්‍රස් පක්ෂයේ නායක අධිකරණ අමාත්‍ය රාවුෆ් හකීම් අමාත්‍යවරයා එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරියට ඉස්ලාම් භක්තිකයන්ට එරහිව සිදුකරනු ලැබූ ප්‍රහාර පිළිබඳව සකස් කරන ලද වාර්තාවක් භාරදීම සම්බන්ධයෙන් විශාල පලිගැනීමකට ලක්වනු දැකිය හැකි වීමය[17].

අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ජනාධිපතිවරයා එලෙස වාර්තාවක් භාර දීම පිලිබඳව අමාත්‍යවරයාට දෝෂාරෝපණය කර ඇති අතර ඔහුට ආණ්ඩුව තුළ රැඳී සිටීමට අවශ්‍යදැ'යි විමසා ඇත. ආණ්ඩුවේ සහාග පක්ෂයක් වන ජාතික හෙළ උරුමය පුවත් නිවේදනයක් නිකුත් කරමින් කියා සිටිනු ලැබුවේ මුස්ලිම් ජාතිකයන්ගේ ආගමික නිදහස උල්ලංඝණය වන බව පවසමින් රටට විරුද්ධ වාර්තාවක් එක්සත් ජාතීන්ගේ සංවිධානයට භාරදීම ලැජ්ජා සහගත සහ පහත් ප්‍රතිපත්තියක් බවයි. එමෙන්ම ඔවුන් ජනපතිවරයාගෙන් ඉල්ලා සිටිනු ලැබුවේ මුස්ලිම් කොන්ග්‍රස් නායකයා පිළිබඳව දැඩි පියවර ගත යුතු බවයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය ලංකාව ජාත්‍යන්තර පරික්ෂණයට භාජනය විය යුතු බව සාධාරණීකරණය කරමින් සකසා ඇති වාර්තාවකට අමාත්‍ය රාවුෆ් හකීම් අමාත්‍යවරයා සහයෝගය ලබා දී ඇති බවට ආණ්ඩුවේ සහාග පක්ෂයක් වන ජාතික නිදහස් පෙරමුණ විසින් ප්‍රකාශ කර ඇත. ජනපතිවරයාගේ සමීපතම අමාත්‍යවරයකු වන තරුණ කටයුතු අමාත්‍ය ඩලස් අලහප්පෙරුම ප්‍රකාශ කරනු ලැබුවේ රාවුෆ් හකීම් අමාත්‍යවරයා ජාතියට එරෙහිව ද්‍රෝහී ක්‍රියාවක් කර ඇති බවයි. තවදුරටත් ඔහු ප්‍රකාශ කර සිටියේ යුද්ධය කාල සීමාවේ රාවුෆ් හකීම් සහ වේලුපිල්ලේ ප්‍රභාකරන් අතර ගිවිසුම් ගණනාවක් අත්සන් කර තිබූ බවයි. මහජන සම්බන්ධතා අමාත්‍ය මර්වින් සිල්වා රාවුෆ් හකීම් අමාත්‍යවරයාට අවවාද කරනු ලැබුවේ මවුබිමට ද්‍රෝහි වන පුද්ගලයන් ප්‍රභාකරන් ගේ ඉරණම (මරණය) මතක තබා ගත යුතු බවටයි. බොදු බල සේනාවේ නායක පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර හිමියන් ප්‍රකාශ කළේ අමාත්‍ය හකීම් "පරයෙක්" බවත් ඔහුට තවදුරටත් ක්‍රියාත්මක වීමට ඉඩ නොතබන බවත්ය. තවදුරටත් කියා සිටියේ හකීම් අමාත්‍යවරයා එක්සත් ජාතීන්ගේ සංවිධානයට තොරතුරු ලබා දීම සම්බන්ධයෙන් සිංහල ජාතියෙන් සමාව ගතයුතු අතර එසේ නැතහොත් එයට ප්‍රතිවිපාක ලෙස මුස්ලිම් ජාතිකයන්ට ලංකාවේ වෙළෙඳපොළෙන් 90%ක් අහිමි විය හැකි බවයි. හකීම් අමාත්‍යවරයා කියා සිටියේ බොදු බල සේනා, රාවණා බලය, සිහල රාවය වැනි අන්තවාදී සංවිධාන පාලනයකින් තොරව ක්‍රියා කරන බවත් රජය මගින් ඔවුන් දැඩි පාලනයකට ලක් කළ යුතු බවත් ආගමික ස්ථාන වලට පහර දීම නැවැත්වීමට මෙවැනි අන්තවාදී සංවිධාන වලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කළ යුතු බවත්ය. මුස්ලිම් කොන්ග්‍රස් නායකයා තවදුරටත් ප්‍රකාශ

[17] See Sri Lanka Brief Briefing note 8/3 – 24 March 2014 http://srilankabrief.wordpress.com/

කරනු ලැබුවේ රජය ගන්නා යම් ක්‍රියාමාර්ග ගැන තම පක්ෂය කළකිරෙන බව සහ එවන් ක්‍රියා දැඩිව හෙළා දකින බවයි.

## ඌ. ගෝලීය කාන්තා කටයුතු පිළිබඳ ඇමරිකානු තානාපතිනියට වීසා ලබාදීම ප්‍රතික්ෂේප කිරීම

### 12. ස්ත්‍රී මානව හිමිකම් ආරක්ෂිකාවන්

කාන්තා කටයුතු පිළිබඳ ඇමරිකානු තානාපති කැතරින් රසල් හට වීසා ලබාදීම ශ්‍රී ලංකා බලධාරීන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම සම්බන්ධයෙන් ඇමරිකා එක්සත් ජනපදය සිය කනස්සල්ල පළ කර ඇත[18]. ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය ප්‍රකාශ කරනු ලැබුවේ ඇයගේ ගමන කල් දැමීමට පමණක් ඉල්ලා සිටි බවයි.[19] එහෙත් මෙම ප්‍රකාශය කොළඹ ඇමෙරිකානු තානාපති කාර්යාලය ප්‍රතික්ෂේප කර ඇත. ලොව පුරා කාන්තාවන් සමාජීයව සහ දේශපාලනිකව සවි බල ගන්වමින් සාමය ස්ථාවරත්වය ඇති කිරීමට කටයුතු කරන කැතරින් රසල් පෙබරවාරි දහය හා එකොලොස් වන දින ශ්‍රී ලංකාවේ සංචාරයක නිරතවීමට නියමිතව සිටියාය.

## එ. අදහස් ප්‍රකාශකිරීමේ නිදහසට එරෙහිව පහරදීම් හා බාධා

### 13. දයා නෙත්තසිංහ

ගාල්ල දිස්ත්‍රික්කයේ මොරවක පරගල හරහා සියඹලාගොඩට වැටී ඇති මාර්ගය පිළිසකර කර දෙන ලෙස ඉල්ලා කරනු ලැබූ විරෝධතාවයක් වාර්තා කිරීමට ගිය ලංකා පුවත්පතේ මාධ්‍යවේදී දයා නෙත්තසිංහ හට ප්‍රභූන් ගමන්කරන මාර්ගයක් අවහිර කර උද්ඝෝෂණයේ යෙදීම යන චෝදනාව යටතේ අධිකරණය ඉදිරියේ පෙනී සිටින ලෙස සිතාසි නිකුත් කර ඇත[20]

### 14. සමාජවාදී කලා සංගමයේ වීදි නාට්‍ය කණ්ඩායම

කළුතර දිස්ත්‍රික්කයේ පානදුර බස් නැවතුම්පල ඉදිරිපිට වීදි නාට්‍යයක් රග දක්වමින් රටේ වර්තමාන දේශපාලන තත්වය පිළිබඳව ජනතාව දැනුවත් කරමින් සිටි ජනතා විමුක්ති පෙරමුණට අයත් සමාජවාදී කලා සංගමයේ සාමාජිකයන් පිරිසකට රජයට සම්බන්ධ බව පවසන මැර කණ්ඩායමක් යකඩ පොලුවලින් පහරදීමෙන් නවදෙනකු තුවාල ලබා රෝහල් ගත කරන ලද අතර ඉන් තුන් දෙනකුගේ තත්වය බරපතල බව වාර්තා විය.[21]

[18] http://www.sundaytimes.lk/140209/news/us-envoys-visit-us-embassy-rejects-eam-statement-85098.html
[19] http://www.mea.gov.lk/index.php/en/media/statements/4396-alleged-refusal-of-a-visa-for-catherine-russell-the-united-states-ambassador-at-large-for-global-womens-issues
[20] http://www.globaltamilnews.net/MobileArticle/tabid/81/language/si-LK/Default.aspx?pn=home&aid=103608
[21] http://www.lankatruth.com/home/index.php?option=com_content&view=article&id=6602:govt-thugs-attack-street-drama-troupe-&catid=36:top-stories&Itemid=124

## ඒ. සාමකාමීව එක්රැස් වීමේ නිදහසට එරෙහි මර්දනය

### 15. ඇන්තනි ප්‍රනාන්දු සමරුවට සහභාගිවූවන්

2014 පෙබරවාරි 15 වන දින හලාවත නගරයේදී වසර කිහිපයකට පෙර ධීවර අරගලයකදී මියගිය ඇන්තනී ප්‍රනාන්දු සමරා කරන ලද උද්ඝෝෂණය වැලැක්වීම සඳහා පොලීසිය විසින් හලාවත මහේත්‍රාත් අධිකරණයෙන් ඉල්ලා සිටින ලද වාරණ නියෝගය මහේත්‍රාත්වරයා විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

ඇන්තනි ප්‍රනාන්දු සමරු උද්ඝෝෂණය ධීවර සමිති, සිවිල් සංවිධාන, සහ විපක්ෂ නායකවරයාගේ සහභාගීත්වයෙන් පෙබරවාරි 15 වන දින හලාවත නගරයේ දී පැවැත්වුනු අතර උද්ඝෝෂණයට සහභාගී වු පිරිස අතරට යකඩ පොලු රැගත් සිවිල් ඇඳුමින් සැරසුණු කණ්ඩායමක් පැමිණි අතර ඔවුන් අත්අඩංගුවට ගන්නා ලෙස සංවිධායකයන් පොලීසියෙන් ඉල්ලා සිටි විට, උසස් පොලිස් නිලධාරියෙක් ප්‍රකාශකරනු ලැබුවේ, ඔවුන් බුද්ධි අංශ නිලධාරීන් බව සහ ඔවුන් නිසි ලෙස තම කාර්යය ඉටු නොකළ බවත්ය.[22]

මෙලෙස සිවිල් ඇඳුමින් සැරසුණු කණ්ඩායමක් යෙදවීම පිළිබඳව සංවිධායකවරු විරෝධය පළ කරන විට හලාවත ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා සංවිධායකයන්ට බලපෑම් කරමින් කියා සිටියේ අදාළ උද්ඝෝෂණය නවතා දැමිය යුතු බවයි.[23]



*2014 පෙබරවාරි 15 - සමරු රැස්වීමට ධීවර ජන පවුල් දරුමල්ලන් ද සමග එක්වූයේ සාමකාමී විරෝධතාවයක යෙදීමටය. (ඡායාරූපය - විකල්ප)*

[22] http://www.vikalpa.org/?p=19586
[23] http://www.vikalpa.org/?p=19617

උද්ඝෝෂණයට සහභාගි වූ අයගේ ඡායාරූප ගැනීමට පොලීසිය විසින් ඡායාරූප ශිල්පීන් යොදවා සිටි අතර, ඒ පිළිබඳව පොලීසියෙන් උද්ඝෝෂණය සංවිධානය කළ සංවිධායකයන් විමසා සිටි විට උසස් පොලිස් නිලධාරියෙක් 'ඇයි අපිට පොටෝ ගන්න බැරිද?' කියමින් තම නිලධාරියකුට ජංගම දුරකථනයෙන් විරෝධතාවයට සහභාගී වූ අය පොටෝ ගැනීමට නියම කරන ලදී.[24]

## 16. *සර්ච් ෆෝ කොමන් ග්‍රවුන්ඩ්* සහ ප්‍රාදේශීය ජනමාධ්‍යවේදී පිරිසක්

*සර්ච් ෆෝ කොමන් ග්‍රවුන්ඩ්* රාජ්‍ය නොවන සංවිධානය විසින් ජනමාධ්‍යවේදීන් උදෙසා "සාමය සොයා" තේමාව යටතේ පොලොන්නරුවේ හෝටලයක පැවැත්වූ දෙදින වැඩමුළුව බෞද්ධ භික්ෂූන් පිරිසක් විසින් විරෝධය පළ කර මැදිහත් වීමෙන් පසු නවතා දමන ලදී. එම භික්ෂූන් පිරිස ප්‍රකාශ කරනු ලැබුවේ ඇමරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවට එරෙහිව යෝජනාවක් එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඉදිරිපත් කරන බැවින් ඇමරිකා එක්සත් ජනපදයේ ආධාර මත පවත්වනු ලබන වැඩසටහන් පොලොන්නරුව දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට ඉඩ දිය නොහැකි බවයි.[25]

## 17. ශ්‍රී ලංකා නීතිඥ සංගමය

ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් සන්නද්ධ හමුදා සඳහා පොලිස් බලතල පැවරීම පිළිබඳව නිකුත් කර ඇති ගැසට් නිවේදනය පිළිබඳව සාකච්ඡා කිරීමට සංවිධානය කර තිබූ මහජන සම්මන්ත්‍රණය පැවැත්වීමට නියමිත ශාලාවේ වෙන් කිරීම බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පාලනාධිකාරිය විසින් හදිසියේ අවලංගු කර ඇත. මේ සම්බන්ධයෙන් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පාලනාධිකාරය විසින් ප්‍රකාශ කර තිබුනේ අදාළ දිනවල ජනාධිපතිවරයා පැමිණෙන බැවින් ආරක්ෂක හේතූන් මත මෙම වෙන් කිරීම අවලංගු කළ බවයි.[26]

## 18. ජල දූෂණයට එරෙහි වූ තුන්තාන ගම් වැසියන්

කර්මාන්ත ශාලාවකින් පිට වන අපද්‍රව්‍ය නිසා සිය පානීය ජලය දූෂණය වී ඇතැයි විරෝධතාවයක යෙදුණු හංවැල්ල තුන්නාන ගම් වැසියනට පහර දී කඳුළු ගෑස් ප්‍රහාරයක් එල්ල කළ පොලීසිය විරෝධතාකරුවන් ගණනාවක්ම අත් අඩංගුවට ගන්නා ලදී.[27] ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියකු ''බල්ලෝ, මෙතැනින් පලයව්, නැත්නම් මැරුම් කාපල්ලා'' යැයි විරෝධතාකරුවන්ට තර්ජනය කළේය. පසුව සිය ජීවිතවලට ආදරය කරන්නේ නම් විරෝධතා උපවාසය වහාම අතහැර දමන ලෙස තවත් උසස් පොලිස් නිලධාරියකු ගම්වැසියනට තර්ජනය කළේය. විරෝධතාවයේ යෙදුණු ගම්වැසියනට කඳුළු ගෑස් ගසා, බැටන් ප්‍රහාර දීම පිණිස අවට පොලීසි 25 කින් නිලධාරීන් කැඳවා තිබුණි. ආරක්ෂාව පතා අසළ බෞද්ධ පන්සලකට ගොඩ වැදුනු උද්ඝෝෂකයන් හඹා ගොස් එතැනින් පළවා හැරීමට ක්‍රියා කළ පොලීසිය පන්සලෙහි ආගමික වතාවත්වල යෙදෙමින් සිටි බෞද්ධ හිමිවරුනට සහ බැතිමතුන්ට ද පහර දුන්නේ ය.

---

24 http://www.vikalpa.org/?p=19683
25 http://www.srilankabrief.org/2014/03/sri-lanka-monks-break-up-us-sponsored.html#more
26 http://www.sundaytimes.lk/140309/news/vesting-of-police-powers-in-the-armed-forces-bmich-cancels-basls-booking-for-a-forum-88460.html
27 https://srilankamirror.com/news/13937-20-arrested-over-thunnana-protest, http://www.srilankabrief.org/2014/03/get-out-you-dogs-if-you-dont-come-out.html#more

පොලිස් ප්‍රහාරයන් නිසා කුපිත වූ ගම්වැසියෝ පාර අවහිර වන සේ ගස් කපා මාර්ගයේ ටයර් ගිනි තැබූහ. උද්ඝෝෂණය මැඩ පැවැත්වීමෙහි යෙදී සිටි බොරුල්ල පොලීසියේ ප්‍රධාන පරීක්ෂකවරයා වූ ප්‍රසාද් සිරිවර්ධන මහතා පාරට කපන ලද ගසකට යට වී බරපතල තුවාල ලබා පසුව මිය ගියේ ය.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් විවිධ මාධ්‍යවල එකිනෙකට වෙනස් තොරතුරු පළ වී තිබුණ ද ජල දූෂණයට විරුද්ධව උද්ඝෝෂණයේ යෙදී සිටි ගම්වැසියන් මර්දනය කිරීම පිළිබඳ මූලික කරුණ සත්‍ය බව පෙනේ.

## ඉ. විශ්ව විද්‍යාල ශිෂ්‍ය ක්‍රියාකාරීන්ට එරෙහිව සිදුකරනු ලබන මර්දනය

**19. මහේෂ් සංජීව බණ්ඩාර**

අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වන මහේෂ් සංජීව බණ්ඩාර රිමාන්ඩ් බන්ධනාගාර ගත කරන මෙන් ඉල්ලමින්, කොළඹ අපරාධ විමර්ශන කොට්ඨාශය ජනවාරි 23 දින කොටුව මහේස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කරන ලද බී වාර්තාව ප්‍රතික්ෂේප කරමින් ඔහු රුපියල් ලක්ෂයක ශරීර ඇප දෙකක් මත මුදාහරින ලෙස නියෝග කරනු ලැබීය. 2013 නොවැම්බර් 13 දින කොටුව සිට පිටකොටුව දෙසට වාහන ගමනාගමනයට අවහිර වන ලෙස උද්ඝෝෂණයක් පවත්වමින් මහජනයාට අවහිර වන ලෙස හැසිරුනු බවට චෝදනා කරමින් මෙම බී වාර්තාව ගොනු කර තිබුණි[28]

උද්ඝෝෂණවලට සහභාගි වීම මගින් මගින් මහජන පීඩාවක් කරනු ලැබීයයි චෝදනා කරමින්, විශ්වවිද්‍යාලවලට ඇතුල් නොවන ලෙසටත්, උද්ඝෝෂණවලට සහභාගී නොවන ලෙසටත්, කොටුව මහේස්ත්‍රාත් වරයා විසින් ලබාදුන් තීන්දුව ප්‍රතිශෝධනය කරන මෙන් ඉල්ලා සිටිමින් අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු සංජීව බණ්ඩාර ඉදිරිපත් කරන ලද පෙත්සම සංශෝධිත පැමිණිල්ලක් ලෙස ඉදිරිපත් කරන ලෙස කොළඹ මහාධිකරණ විනිසුරුවරයා නියෝග කරන ලදී. එවැනි කොන්දේසි මගින් තමන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වන බව පැමිණිලිකරු කියා සිටින ලදී.[29]

අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු සංජීව බණ්ඩාර පොලිස්පතිවරයාට 2014 ජනවාරි 28 දින යොමුකරන ලද ලිපියක් මගින් දන්වා ඇත්තේ 2014 ජනවාරි 27 දින කොළඹ මහජන පුස්තකාලයේ පැවති රැස්වීමක් අවසන් වී ඔහු ඇතුළු පිරිස ගමන්ගත් රථය පසුපස ත්‍රිරෝද රථයකින් හා යතුරු පැදි කිහිපයකින් කණ්ඩායමක් හඹා ආ බවයි. ඔවුන්

---

[28] මවුබිම පුවත්පත 2014 ජනවාරි 25 වන දින වාර්තාකර තිබුනි.
[29] ලංකාදීප පුවත්පත 2014 ජනවාරි 10 වනදින වාර්තා කරතිබුනි.

ආරක්ෂක අංශවලට සම්බන්ධ පිරිසක් බවට සැක කරන බවත් එය අනියම් අන්දමට කරන ලද තර්ජනයක් බවත් ඔහු වැඩි දුරටත් දක්වා ඇත.[30]

### 20. රජරට විශ්ව විද්‍යාලයේ පීඨ හතරක සිසු සිසුවියන්

ශිෂ්‍ය ක්‍රියාකාරීන් 27 දෙනකුගේ පන්ති තහනම් කිරීමට විරෝධය පළ කරමින් රජරට විශ්ව විද්‍යාලයේ පීඨ 4 ක සිසුන් දින 80 කට වැඩි කාලයක් රජරට විශ්ව විද්‍යාලය ඉදිරිපිට සත්‍යග්‍රහයක නියැලෙමින් සිටි අතර විශ්ව විද්‍යාල සිසුන්ගේ සත්‍යග්‍රහය නීතිවිරෝධි බව ප්‍රකාශකරමින් අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණය නියෝගයක් නිකුත් කර ඇත.[31] මෙම සත්‍යග්‍රහයෙන් අනෙකුත් විශ්වවිද්‍යාල සිසුන්ට බාධා සිදුවන බව පවසමින් එම විශ්වවිද්‍යාලයේ විනය භාර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය රන්දෙනි කෝරාලලාගේ ධර්මසිරි රන්දෙණිය මිහින්තලය පොලීසියට පෙබරවාරි 24 වන දින පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත[32]

## ඊ.මානව හිමිකම් උල්ලංඝණයන්ට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණ සභාය පතන්නන්ට කරන තර්ජන

### 21. කසන්කානි, අෂ්රෆ් නගර් පදිංචිකරුවන්

අම්පාර දිස්ත්‍රික්කයේ කසන්කානි, අෂ්රොෆ් නගර්හි පදිංචිකරුවන් තිදෙනෙක් යුද හමුදාව විසින් නිරන්තරයෙන් ඔවුන් හට වද හිංසා හිරිහැර කිරීම නිසා ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවට පැමිණිල්ලක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. මෙම පැමිණිලිකරුවන් විසින් තමන්ගේ බලපත්‍ර සහිත ඉඩම් හමුදා කඳවුරක් සඳහා බලහත්කාරයෙන් අත්පත් කර ගැනීමට විරුද්ධව මූලික අයිතිවාසිකම් නඩුවක් පවරා ඇති බැවින් හමුදාව මෙලෙස නිරන්තරයෙන් තමන් පීඩාවට පත්කරන බවට චෝදනා කරනු ලබයි.[33]

## එ. ආගමික නිදහස වෙනුවෙන් පෙනී සිටියෙකුට එරෙහි මර්දනය

### 22. පූජ්‍ය වටරැක විජිත හිමි

මාර්තු මස 14 වන දින පූජ්‍ය වටරැක විජිත හිමියන්[34] කොළඹ නවාතැන් ගෙන සිටින පන්සලට දානය රැගෙන ආ බොදු බල සේනාවට සම්බන්ධ ප්‍රාදේශීය දේශපාලකයකු උන්වහන්සේ එම පන්සලේ සිටිනු දැක ඇති අතර එදින සවස අදාල පන්සලේ නායක ස්වාමීන් වහන්සේට තවදුරටත් විජිත හිමියන්ට පන්සලේ රැකවරණය දුන්හොත් ප්‍රතිවිපාක විඳීමට සිදුවිය හැකි බව පවසමින් බොදු බල සේනාවෙන් තර්ජනාත්මක දුරකථන ඇමතුමක් ලැබුනි. එදින සිට වටරැක විජිත හිමියන් විවිධ ප්‍රදේශවල, විවිධ ස්ථානවල රැකවරණය ලබයි.

---

30 අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු සංජීව බන්ඩාර 2014 ජනවාරි 28 දින පොලිස්පති වරයාට යවන ලද ලිපිය.

31 http://www.colombopage.com/archive_14A/Feb18_1392704153JV.php

32 http://www.dinamina.lk/2014/02/25/_art.asp?fn=n1402257

33 http://www.thesundayleader.lk/2014/03/09/ashraff-nagar-residents-seek-hrc-solution/

34 http://groundviews.org/2013/10/09/buddhist-monk-attacked-by-bodu-bala-sena-and-police-inaction/



2014 අප්‍රේල් 10 - වෛරකාරී බොදු බල සේනා පිරිස් වාඩිවී සිටින විජිත හිමියනට ප්‍රසිද්ධියේ නොසරුප් වචනයෙන් බැණ වැදී තර්ජනය කළහ. ( ඡායාරූපය - නෙත් එෆ්එම්)

මාර්තු 24 වන දින ගෝල්ෆේස් පිටියේ පූජ්‍ය වටරැක විජිත හිමියන් සහ වෙනත් ආගමික නායකයන් එක්ව පසුගිය කාලය තුල දිගින් දිගටම සිදු වූ සුළුතර ආගමිකයන්ට සිදුවූ හිංසාවන්වලට විරෝධය පාමින් පැවැත්වීමට නියමිතව තිබු අන්තර් ආගමික සහජීවනය සඳහා වූ උද්ඝෝෂණය උසාවි නියෝගයක් මගින් හයිඩ්පාක් පිටියේ පවත්වන ලෙස නියෝගකරන ලදී.[35]

මාර්තු 30 වන දින පූජ්‍ය වටරැක විජිත හිමියන්ට තර්ජනය කිරීම සම්බන්ධ නඩුව අධිකරණය හරහා සමථ මණ්ඩලයට යොමුකර තිබු අතර විජිත හිමියන්ට පහර දීමේ චෝදනාවට ඇප මත නිදහස් වී සිටින කේ.පී. ගුණවර්ධන අසනීප තත්වයේ සිටින බැවින් පැමිණීමට නොහැකි බව ලිපියක් මගින් දැනුම් දීම නිසා වෙනත් දිනයකට කල් දමන ලදී.

## ඊ. මැතිවරණ කාල සීමාව තුල විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය

### 23. විපක්ෂ දේශපාලන පක්ෂ

දකුණු සහ බස්නාහිර පළාත් සභා මැතිවරණය මාර්තු මාසයේ 29 වන දින පැවැත්වුනු අතර දීර්ඝ කාලයක් තිස්සේ මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක් ලෙස කටයුතු කරන පැෆරල් සංවිධානය ප්‍රකාශකරන ආකාරයට[36] මෙම මැතිවරණය සම්පූර්ණ නිදහස් සහ සාධාරණ එකක් ලෙස හැඳින්විය නොහැකි අතර, මැතිවරණය පැවැත්වුන කාලසීමාව තුළ මැතිවරණ නීති උල්ලංඝණය කිරීම් බරපතල වශයෙන් සහ ඉතා බහුල ලෙස සිදුවූ අතර මේ සඳහා රජයේ ඉහළම තලවල සිටින්නන් සම්බන්ධ බවයි. පැෆරල් සංවිධානයට අනුව බොහෝ උල්ලංඝණය කිරීම්වලට වගකිව යුත්තේ පාලක පක්ෂයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් සහ අපේක්ෂකයන් වන අතර රජයේ

[35] http://www.lankadeepa.lk/index.php/articles/219626
[36] 2014 මාර්තු 29 වන දින පැෆරල් සංවිධානයේ මාධ්‍ය නිවේදනය

කාර්යාල, රාජ්‍ය සේවකයන් හා රාජ්‍ය වාහන ඡන්ද ව්‍යාපාර සඳහා අයුතු ලෙස යොදා ගෙන ඇත.

පැෆරල් සංවිධානයට ලැබුණු පැමිණිලි අනුව ඡන්ද ව්‍යාපාරවලට බාධා කිරීම විශාල වශයෙන් සිදු වී ඇති අතර ඉන් බොහොමයක් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ අපේක්ෂකයන්ට විරුද්ධව සිදු වී ඇත. තව ද පළාත් පාලන ආයතන මගින් මැතිවරණ රැස්වීම් සඳහා ස්ථාන ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත. පැෆරල් සංවිධානය අවධාරණය කර සිටින්නේ විරුද්ධ දේශපාලන පක්ෂවල අපේක්ෂකයන්ගේ තත්වය යහපත් කිරීමට තවත් ක්‍රියාමාර්ග ගත යුතු බවයි.